සැ. යු. — 2015.03.27 දින පළ වූ අංක 1,908 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,909 - 2015 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 658 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 660 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 24 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**

රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## මහ නගර සභාව - රත්නපුර

දැන්වීමයි

රත්නපුර මහ නගර සභා ප්‍රදේශයට අදාළව ඉතා ගැඹුරින් අධ්‍යයනක් සහ විශ්ලේෂණයක් මගින් සකස් කර ඇති ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම සඳහා එක්සත් ජාතීන්ගේ ජනාවාස සංවර්ධන වැඩසටහන මොරටුව විශ්වවිද්‍යාලය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජාව හා ප්‍රජා සංවිධාන ආදියෙහි දායකත්වය ලබාදී ඇත. මෙය 2014.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ යුතු බවට 2013.10.30 දින පැවති මහ සභාවේ දී යෝජනා අංක 05:4 අනුව අනුමත කර ඇති බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

එකී සංවර්ධන සැලැස්ම මහ නගර සභාවේ ප්‍රදර්ශනය කර ඇති අතර කාර්යාලයීය වේලාවේ දී ඕනෑම පුරවැසියකුට එය පරීක්ෂා කළ හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

නිලන්ත රොෂාන් ගොඩහේන,
නගරාධිපති,
මහ නගර සභාව,
රත්නපුර.

04-193

---

## මොරටුව මහ නගර සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 2015 වර්ෂයට විශේෂ බලපත්‍ර ඉල්ලුම්කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීම හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ඇතුලත මා වෙත ලියා එවීමට බල ඇති බවත් (272 වැනි අධිකාරිය) සෝගාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2015 මාර්තු මස 16 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|
| කේ. දර්ශන අංක 577, ප්‍රැන්සිස්කු ලේන්, මොරටුවැල්ල, මොරටුව. | අංක 593/6, ද සොයිසා පාර, මොරටුමුල්ල, මොරටුව | හරක් මස්, එළුමස් වෙළඳාම | ඒ. එම්. අමාන් මීට් ෂොප් |

04-69

---

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2014.11.25 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක්

ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*මාර්ග විස්තරය :*

| *දිග* | | *පළල* |
|---|---|---|
| කි. මී. 01 | | අඩි 08 |
| මාර්ගයේ නම | :- | බැද්දවල ගමමැද වටරවුම් පාර |
| වසම | :- | බැද්දවල |
| ආරම්භය | :- | බැද්දවල ජේෂකර්ම මධ්‍යස්ථානය |
| අවසානය | :- | පිං කුඹුර |

බැද්දවල ජේෂකර්ම මධ්‍යස්ථානය අසලින් ආරම්භවන වම් පසින් වයි. එම්. ලොකු බණ්ඩා සහ වයි. එම්. ජයතිස්ස බණ්ඩා යන අයට අයත් යාපාගේ හිටිනාවත්ත සහ ගෙදර කුඹුර, එච්. එම්. බිසෝ මැණිකේ යන අයට අයත් කරද සහ දික්කුඹුර, ඊ. එම්. ඒ. ඒකනායක යන අයට අයත් කුඹල් අංග කුඹුර, අයි. එම්. චින්තක බංඩාර යන අයට අයත් කාසියා කුඹුර, අයි. එම්. අසිත රංග බණ්ඩාර යන අයට අයත් කුඹලන්ගේ කුඹුර, එච්. ජී. යූ. ඒකනායක යන අයට අයත් කාසියා කුඹුර, එච්. එම්. බිසෝ මැණිකේ යන අයට අයත් පටලාපිටියවත්ත, වයි. කේ. නන්දාවතී මැණිකේ යන අයට අයත් පටලාපිටිය වත්ත, අයි. එම්. ගාමිණී බංඩාර යන අයට අයත් දොඹේ කුඹුර, ආර්. එම්. ඒ. සමරකෝන් යන අයට අයත් දොඹේ කුඹුර, ඩබ්ලිව්. ඒ. ගුණතිලක යන අයට අයත් වත්තේ ගෙදර දොඹේ කුඹුර, ඩබ්ලිව්. ඒ. ටිකිරි බංඩා යන අයට අයත් දොඹේ කුඹුර, ඩබ්ලිව්. එම්. අතුල තේජ හේමන්ත වීරකෝන් යන අයට අයත් දෙනියවත්ත, යන ඉඩම්වලින් ද,

දකුණුපසින් වයි. එම්. ලොකුබණ්ඩා සහ වයි. එම්. ජයතිස්ස බණ්ඩා යන අයට අයත් යාපාගේ හිටිනාවත්ත සහ ගෙදර කුඹුර, එච්. එම්. බිසෝ මැණිකේ යන අයට අයත් කරද සහ දික්කුඹුර, ඊ. එම්. ඒ. ඒකනායක යන අයට අයත් කුඹල් අංග කුඹුර, අයි. එම්. චින්තක බංඩාර යන අයට අයත් කාසියා කුඹුර අයි. එම්. අසිත රංග බණ්ඩාර යන අයට අයත් කුඹලන්ගේ කුඹුර, එච්. ජී. යූ. ඒකනායක යන අයට අයත් කාසියා කුඹුර, එච් එම්. බිසෝ මැණිකේ යන අයට අයත් පටලාපිටියවත්ත, වයි. කේ. නන්දාවතී මැණිකේ යන අයට අයත් පටලාපිටියවත්ත ,අයි. එම්. ගාමිණී බංඩාර යන අයත් දොඹේ කුඹුර, ආර්. එම්. ඒ. සමරකෝන් යන අයට අයත් දොඹේ කුඹුර, ඩබ්ලිව්. ඒ. ගුණතිලක යන අයට අයත් වත්තේ ගෙදර දොඹේ කුඹුර, ඩබ්ලිව්. ඒ. ටිකිරි බංඩා යන අයට අයත් දොඹේ කුඹුර, ඩබ්ලිව්. එම්. අතුල තේජ හේමන්ත වීරකෝන් යන අයට අයත් දෙනියවත්ත, යන ඉඩම්වලින් ද මායිම් වන්නාවූ බැද්දවල ගම මැද වටරවුම් පාර.

*මාර්ග විස්තරය :*

| *දිග* | | *පළල* |
|---|---|---|
| මීටර් 800 | | අඩි 08 |
| මාර්ගයේ නම | :- | බැද්දවල ගමමැද වටරවුම් පාර නාඹුරුව දක්වා |
| වසම | :- | බැද්දවල |
| ආරම්භය | :- | බැද්දවල ගම මැද වටරවුම් පාර කුඹලන්ගේ කුඹුර අසලින් |
| අවසානය | :- | බැද්දවල නාඹරුව |

බැද්දවල ගමමැද වටරවුම් පාරේ කුඹලන්ගේ කුඹුර අසලින් ආරම්භවන වම්පසින් කේ. එම්. ඒ. කුමාරසිංහ යන අයට අයත් කුඹලන්ගේ කුඹුර, ආර්. එම්. අයි. උපාලි බංඩාර රත්නායක යන අයට අයත් පාලුවත්ත දෙනිය, අයි. එම්. ගාමිණී බංඩාර යන අයට අයත් හිටිනාවත්ත, ආර්. එම්. තිලකරත්න යන අයට අයත් ගල් ගොඩේහේන, ඊ. එම්. ඒකනායක යන අයට අයත් ගල්ගොඩේහේන, ඩී. ඒ. අසංක කීර්ති බණ්ඩාර දාස්වත්ත යන අයට අයත් හපුගහමඩහේන, යන ඉඩම්වලින් මායිම් වන්නාවූ ද,

දකුණුපසින් කේ. එම්. ඒ. කුමාරසිංහ යන අයට අයත් කුඹලන්ගේ කුඹුර, ආර්. එම්. අයි. උපාලි බංඩාර රත්නායක යන අයට අයත් පාලුවත්ත දෙනිය, අයි. එම්. ගාමිණී බංඩාර යන අයට අයත් හිටිනාවත්ත, ආර්. එම්. තිලකරත්න යන අයට අයත් ගල්ගොඩේහේන, ඊ. එම්. ඒ. ඒකනායක යන අයට අයත් ගල්ගොඩේහේන, ඩී. ඒ. අසංක කීර්ති බණ්ඩාර දාස්වත්ත යන අයට අයත් හපුගහමඩහේන, යන ඉඩම් වලින් මායිම් වන්නාවූ බැද්දවල ගමමැද වටරවුම් පාර නාඹරුව දක්වා මාර්ගය

මාර්ග විස්තරය

| *දිග* | | *පළල* |
|---|---|---|
| මී. 148 | | අඩි 10 |
| මාර්ගයේ නම | :- | සියඹලාගහමුල ජනපද මාර්ගය |
| වසම | :- | යෝධගම |
| ආරම්භය | :- | හිරිවඩුන්න යෝධගම මාර්ගයේ බෝක්කුව අසල සියඹලාගහමුලහේන ජනපදයට හැරෙන හන්දිය අසලින් |
| අවසානය | :- | සියඹලාගහමුලහේන ජනපදයේ සිරියාවතී යන අයගේ ඉඩම අසලින් |

හිරිවඩුන්න යෝධගම මාර්ගයේ බෝක්කුව අසලින් ආරම්භව වම් පසින් බී. ජී. පියසේන සහ බී. ජී. ප්‍රේමසිරි හා බී. ජී. සේනාරත්න, ඩබ්ලිව්. පී පොඩිනෝනා සහ කේ. තිස්ස විජේරත්න, ආර්. ඒ. නිහාල් ප්‍රේමසිරි යන අයට අයත් සියඹලාගහමුලහේන යන ඉඩම් වලින් ද,

දකුණු පසින් එච්. පී. ගාමිණී විජේරත්න, එච්. පී. ප්‍රේමදාස, එච්. පී. නාලනී එදිරිසිංහ, එම්. පී. විලියොන්, ජී. ජී. ප්‍රේමලතා, කේ. පී. සිරියාවතී, එච්. පී. නිමල් පියතිස්ස යන අයට අයත් සියඹලාගහමුලහේන යන ඉඩම් වලින් මායිම්වන්නා වූ යෝධගම සියඹලාගහමුලහේන ජනපදය දක්වා වූ මාර්ගය

04-47/1

---

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2014.12.30 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතුවන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක්

හැටියට සලකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 20 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාර්ග විස්තරය :

| දිග | පළල |
|---|---|
| මීටර් 42 | මීටර් 3 |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | වහව අබේසේකර මාර්ගයෙන් පටන් ගන්නා අතුරු මාර්ගය |
| වසම | :- | වහව |
| ආරම්භය | :- | වහව අබේසේකර මාවත |
| අවසානය | :- | අබේසේකර මාවතින් ආරම්භ වන අතුරු මාර්ගය ඇතුළත කිත්සිරිගේ නිවස |

වහව අබේසේකර මාවතින් ආරම්භ වන වම් පසින් එස්. ඩබ්ලිව්. ගුණතිලක යන අයට අයත් ගොන්දෙනිකන්ද යන ඉඩමින් ද,

දකුණු පසින් එස්. ඩබ්ලිව්. ගුණතිලක යන අයට අයත් ගොන්දෙනිකන්ද යන ඉඩමින් ද මායිම් වන්නා වූ වහව අබේසේකර මාවතින් ආරම්භව කිත්සිරිගේ නිවස දක්වා වූ අතුරු මාර්ගය.

මාර්ග විස්තරය :

| දිග | පළල |
|---|---|
| අඩි 540 | අඩි 12 |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | අන්දිරිමඩ වටහපත්කන්ද වැවේකැල්ල මාර්ගය |
| වසම | :- | හිරිවඩුන්න |
| ආරම්භය | :- | හිරිවඩුන්න ඉඹුල්ගස්දෙණිය මාර්ගයේ අන්දිරිමඩ වැවේකැල්ල ඉඩම |
| අවසානය | :- | වටහපත් කන්ද වැවේකැල්ල |

හිරිවඩුන්න ඉඹුල්ගස්දෙණිය මාර්ගයේ අන්දිරිමඩ වැවේකැල්ල නැමති ඉඩමින් ආරම්භ වන වම්පසින් පී. කේ. ඩී. ගුණපාල පෙරමුණ යන අයට අයත් වටහපත්කන්ද වැවේකැල්ල ජේ. ඒ. පී. එන්. ජයකොඩි, යන අයට අයත් අන්දිරිමඩ වැවේකැල්ල කේ. එම්. ආර්. නවරත්න යන අයට අයත් වටහපත්කන්ද වැවේකැල්ල, එච්. ජී. ගුණරත්න යන අයට අයත් වටහපත්කන්ද වැවේකැල්ල, ජේ. එම්. සඳරුවන් චන්දන ප්‍රදීප්, යන අයට අයත් වටහපත් කන්ද වැවේකැල්ල යන ඉඩම්වලින් ද,

දකුණුපසින් ජේ. ඒ. පී. එන්. ජයකොඩි යන අයට අයත් අන්දිරිමඩ වැවේකැල්ල, ටී. ඩබ්ලිව්. සුජානි කරුණානායක යන අයට අයත් වැවේකැල්ල, එම් ජී. තිලකරත්න බංඩාර යන අයට අයත් වටහපත් කන්ද වැවේකැල්ල, එස්. කේ. ඒ. නානායක්කාර යන අයට අයත් වැවේවත්ත, එච්. ජී. රම්බණ්ඩා, යන අයට අයත් වැවේකැල්ල, එම්. ඩී. ජේ. අයි. කරුණාතිලක යන අයට අයත් වටහපත් කන්ද වැවේකැල්ල (වැවේවත්ත), ආර්. වී. රාජපක්ෂ යන අයට අයත් වැවේකැල්ල යන ඉඩම්වලින් මායිම් වන්නා වූ හිරිවඩුන්න ඉඹුල්ගස්දෙණිය මාර්ගයේ අන්දිරිමඩ වැවේකැල්ල ඉඩමේ සිට වටහපත්කන්ද වැවේකැල්ල දක්වා වූ අන්දිරිමඩ වටහපත්කන්ද වැවේකැල්ල මාර්ගය.

මාර්ග විස්තරය

| දිග | පළල |
|---|---|
| අඩි 450 | අඩි 8 |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | හැරම්ටිපාන මාර්ගය |
| වසම | :- | වරාගොඩ වසම |
| ආරම්භය | :- | කොළඹ නුවර මාර්ගයේ 85/4 බෝක්කුව අසලින් |
| අවසානය | :- | හිටිනාවත්ත ඉඩම |

කොළඹ නුවර මාර්ගයේ 85/4 බෝක්කුව අසලින් ආරම්භව වම් පසින් බී. වී. සාලින්ද ප්‍රදීප් කුමාර යන අයට අයත් පල්බොක්ක වත්ත, වයි. ලයනල් සෙනවිරත්න යන අයට අයත් හිටිනාවත්ත අඹගහමුලහේන, ජී. ජී. රත්නසිරි යන අයට අයත් හැකුඹුර ගොඩ වී පැල හිටිනාවත්ත යන ඉඩම්වලින් ද,

දකුණු පසින් බී. වී. එස්. කරුණාරත්න යන අයට අයත් පල්බොක්ක වත්ත, එම්. බී. ජී. ඉදුනිල් ප්‍රියන්ත රාජවර්ධන යන අයට අයත් හිටිනාවත්ත අඹගහමුලහේන, එම්. බී. නන්දන රාජවර්ධන යන අයට අයත් ආචාරිගේ පොල්වත්ත, යන ඉඩම්වලින් මායිම් වන්නා වූ කොළඹ නුවර මාර්ගයේ 85/4 බෝක්කුව අසල සිට හිටිනාවත්ත දක්වා වූ හැරම්ටිපාන මාර්ගය

04-47/2

# විවිධ දැන්වීම්

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ස්ථාන තෝරා ගැනීම - 2015 වර්ෂය

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පහත සඳහන් ස්ථානවල පදික ව්‍යාපාර කටයුතු කිරීම සඳහා 2015.01.20 වැනි දිනැති රැස්වීමේ දී අංක 2 දරන යෝජනාව මගින් සභා සම්මත කරන ලදී.

*ජංගම හා එක් සතියකට අදාළ ව්‍යාපාර කටයුතු සඳහා :*

නෙඩුන්කේණි - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නව බස් නැවතුම්පොළ,

කනගරායන්කුලම : කනගරායන්කුලම එළවළු වෙළෙඳසැල අසල

පුලියන්කුලම : පුලියන්කුලම එළවළු වෙළෙඳසැල් ඉඩම.

*වාහන නවතා තැබීම :*

නෙඩුන්කේනි නගරයේ නාගතම්බිරාන් දේවාලය අසල

නෙඩුන්කේණි ඔඩ්ඩුසුට්ටාන් හන්දිය

නෙඩුන්කේණි බස් නැවතුම් පොළ - එළවළු වෙළෙඳ පොළ ඉදිරි කොටස.

*කසල ද්‍රව්‍ය වැළලීමේ ස්ථාන :*

සුඩුවෙන්තාන් - පෙරියමඩු සුඩුවෙන්තාන් මාර්ගයේ සිට කිලෝ මීටර් 2ට එපිට.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-134/16

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### ස්ථාන සීමා කිරීම - 2015

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට එළවලු සහ මාලු වෙළඳ සැල් ලබා දී ඇති බැවින් ව්‍යාපාර ස්ථානයේ සිට කි. මී. 2 සීමාව තුළ එළවලු විකිණීම තහනම් කරනු ලබන බව 2015.01.20 වැනි දිනැති රැස්වීමේ අංක 7 දරන යෝජනාව මගින් සම්මත කරන ලදී.

*අයකරනු ලබන අනෙකුත් ගාස්තු :*

| | | |
|---|---|---|
| 01. | පුස්තකාල සාමාජිකත්ව අයදුම්පත් ගාස්තුව | 20 0 |
| 02. | පුස්තකාල ඉතිරිකිරීමේ ගාස්තුව | 100 0 |
| 03. | ග්‍රන්ථ භාරදීමේ දී සිදුවන ප්‍රමාදවීම් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව එක් දිනකට | 1 0 |
| 04. | සාමාජිකත්වය අලුත්කිරීම | 50 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව.

04-134/14

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කරනු ලබන දැන්වීමයි

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 95 දරන උපලේඛනය අනුව මා හට පවරා දී තිබෙන බලතල ප්‍රකාරව වවුනියාව උතුර ප්‍රාදේශීය සභා පරිපාලන සීමා තුල තිබෙන නිවාස සහ ආයතනවල වැසිකිලි අපද්‍රව්‍ය අපගේ වාහන වන ගලිඑම්රියර් මගින් ඉවත් කිරීම සම්බන්ධයෙන් අයකරනු ලබන ගාස්තුව 2013.01.01 වන දින සිට පහත සඳහන් පරිදි අයකිරීමට 2015.01.20 වන දිනැති අංක 2 දරන යෝජනාව සභාව විසින් සම්මත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කර දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ස්වභාවය* | *අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | ගලිඑම්රියර් මගින් වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාළ ගාස්තුව (පරිපාලන සීමාවට අදාළ කොටස) | රු. 8,500 0 |
| 02. | ගලිඑම්රියර් මගින් වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාළ ගාස්තුව (පරිපාලන සීමාවට පිටතින්) | රු. 10,000 0 |
| 03. | සීසෑමේ යන්ත්‍රයෙන් සවිකරන ලද ගලිඑම්රියර් මගින් (කුඩා) වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාළ ගාස්තුව (පරිපාලන සීමාවට අදාළ කොටස) | රු. 5,000 0 |
| 04. | සීසෑමේ යන්ත්‍රයෙන් සවිකරන ලද ගලිඑම්රියර් මගින් (කුඩා) වැසිකිළි අපද්‍රව්‍ය ඉවත් කිරීමට අදාළ ගාස්තුව (පරිපාලන සීමාවට පිටතින්) | රු. 7.500 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-134/15

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### නිදැල්ලේ යන ගවයින් පාලනය කිරීම - 2015 වර්ෂය

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රධාන මාර්ගයේ නිදැල්ලේ ඇවිදින ගවයින් පාලනය කිරීම සඳහා 2015.01.20 දිනැති මහ සභා රැස්වීමේ දී අංක 2 දරන යෝජනාව මගින් පහත සඳහන් පරිදි සම්මත කරන ලදී.

ප්‍රධාන මාර්ග ඇතුළත් නගර ප්‍රදේශයේ දිවා හා රාත්‍රී කාලයේ නිදැල්ලේ යන ගවයින් සැරිසැරීම සම්පූර්ණයෙන් තහනම් කිරීමට ලක්කර ඇත. අනෙකුත් මාර්ගවල රාත්‍රී කාලයේ නිදැල්ලේ සැරිසැරීම තහනම් කර ඇත.

නිදැල්ලේ ඇවිදින ගවයින් අත්අඩංගුවට ගැනීමේ දී එක් ගවයෙකුට දඩ වශයෙන් රුපියල් 1000ක් ද,

කුඩා සතුන් සඳහා රුපියල් 500ක් ද නඩත්තු මුදල් වශයෙන් එක් දිනකට රුපියල් 200ක් අයකරනු ලැබේ.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේනී,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-134/13

---

### වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### පළාත් පාලන සභාව ප්‍රතිසංස්කරණය කිරීමේ චක්‍රලේඛය අනුව දුරකථන කණු සඳහා අයකරනු ලබන අයකිරීම් පිළිබඳ දැන්වීම

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා පරිපාලන සීමා තුළ මාර්ග අයිනේ හිටවනු ලබන සියලුම දුරකථන කණු සඳහා අයකිරීමට, ව්‍යාපාර ගාස්තු අයකිරීම පිළිබඳව පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ ඇමුණුම 1 හි යෝජනාව ද, සහ නිර්දේශය යන කොටසේ මුදල් කළමනාකාරිත්වය සහ ආදායම යන උපමාතෘකාව යටතේ අංක 6.5 දරන කොටසේ ප්‍රකාශ කර ඇති කොන්දේසිවලට යටත්ව දුරකථන කණු සඳහා ව්‍යාපාර බදු මුදලක් අයකිරීමට පසුගිය 2015.01.20 වැනි දින පවත්වන ලද විශේෂ සභා රැස්වීමේ දී අංක 2 දරන යෝජනාව සම්මත කරන ලද අතර පහත සඳහන් උපලේඛනය අනුව දුරකථන කණුව වෙනුවෙන් අයකරනු ලබන බදු මුදල 2015.02.01 වන දින සිට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව මෙයින් ප්‍රසිද්ධ කර දැනුම් දෙනු ලැබේ.

| අංක | ස්වභාවය | අයකිරීම රු. ශත |
|---|---|---|
| 01. | අඩි 24 උස දුරකථන කණුව සඳහා එක් වසරකට වරක් | 120 0 |
| 02. | අඩි 24කින් යුක්ත දුරකථන කණුව හිටවීම සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තුව (ආරම්භක මුදල) | 150 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-134/7

---

### වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(4) වැනි සටහන අනුව වාහන සඳහා බදු නිවේදනය - 2015

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(4) වැනි සටහනට අනුව 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පාපැදි සඳහා බදු මුදල රුපියල් 20 ක් වශයෙන් අය කිරීමට අංක 4 හා 2015.01.20 වැනි දිනැති සභාවේ තීරණය පරිදි සම්මත කරන ලදී. මේ අනුව අදාළ ගාස්තුව අය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේණි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

#### උපලේඛනය

| අංකය | වර්ගය | 2015 වර්ෂයට අයකිරීම රු. ශත |
|---|---|---|
| 01. | එක් එක් පාපැදි සඳහා වාර්ෂික බදු මුදල | 20 0 |

04-134/11

---

### වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (4) සටහන අනුව වාහන සඳහා බදු නිවේදනය - 2015

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 148 (4) වැනි සටහනට අනුව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ 2015 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට 2015 වසරේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වාහන නැවතුම් පොළ ගාස්තුව පහත සඳහන් පරිදි අය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේණි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

#### උපලේඛනය

| අංක | වර්ගය | 2015 වර්ෂයට අයකිරීම රු. ශත |
|---|---|---|
| 01. | එක් එක් ගොන් කරත්තය සඳහා - මාසිකව | 100 0 |
| 02. | සෑම අත් කරත්තය සඳහා - මාසිකව | 100 0 |
| 03. | ත්‍රි රෝද රථ නැවතුම් පල සඳහා බදු මුදල මාසිකව | 600 0 |
| 04. | රෝද දෙකක් සහිත සී සෑමේ යන්ත්‍ර නැවතුම් පළ සඳහා බදු මුදල වාර්ෂිකය (ලෑන්ඩ් මාස්ටර්) | 300 0 |
| 05. | රෝද හතර සහිත සී සෑමේ යන්ත්‍ර | 600 0 |

05-134/12

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(ඊ) වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය - 2015

නළ ලිං සඳහා සේවා ගාස්තු අයකිරීම

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සියළුම නළ ලිං වෙනුවෙන්, නළ ළිඳක් භාවිතා කරන පවුලක් සේවා ගාස්තු වශයෙන් මාසිකව රුපියල් 20ක් 2015.01.01 වන දින සිට අය කරන බව 1987 වර්ෂයේ අංක 15 දරන ආඥාපනතේ 109(ඊ) වගන්තිය අනුව තීරණය කොට මෙයින් ප්‍රකාශ කරමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/10

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

දේපොළ සඳහා බදු අයකිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 134(1) (2) (3) වගන්ති යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටා තිබෙන පහත සඳහන් ග්‍රාම සේවා කොට්ඨාසයේ තිබෙන ගම්මානය මෙම වර්ෂයේ ලබා ඇති සංවර්ධනය අනුව හඳුනාගෙන ඊළඟ වර්ෂ දේපොළ බදු අය කිරීමට අදාළ කටයුතු කළ යුතු බවට තීරණය කරන ලදී.

නෙඩුන්කේනි උතුර
නෙඩුන්කේනි දකුණ
කනගරායන්කුලම් උතුර
කනගරායන්කුලම දකුණ
පුලියන්කුලම උතුර
පුලියන්කුලම දකුණ
මදියාමඩු
නෛනාමඩු

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/9

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ජාතික පාරිසරික පනත යටතේ දැන්වීම - 2015

1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පාරිසරික අධිකාරිය 1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ද 1988 වර්ෂයේ අංක 56 දරන සංශෝධිත පනතේ සැලැස්ම අනුව මධ්‍යම පරිසර සභාපති විසින් අදාළ පනතේ 26 වැනි වගන්තියට අනුකූලව ද පවරන බලතලවල බලය පරිදි 2001 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින සිට පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් බලතල ද රාජකාරි ද සේවාවන් ද ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත පැවරීම මත වවුනියාව උතුරු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල සීමාව තුළ මෙම පනත ක්‍රියාත්මක කරන අතර, පහත දැක්වෙන උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සඳහා මධ්‍යම පාරිසරි අධිකාරිය මගින් නියම කරන ලද පරිදි පෝරම, ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු, හා බලපත්‍ර ගාස්තු යනාදිය නියම කර අයකරන බවට මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි. මෙම ප්‍රකාශය වනාහි අයකරනු ලබන ගාස්තු 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අනුමත කර අය කරන බලපත්‍ර ගාස්තුවට වඩා ඉහළිනුත් ඒවා කොයි ආකාරයෙනුත් වැඩි නොවන ආකාරය ද වේ.

උපලේඛනය

1. 25 දෙනෙකුට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා ඇති සබන්, කුණු ඉවත් කිරීමේ හෝ වෙනත් යම්කිසි පිරිසිදු කිරීමේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවල්.
2. මෙට්‍රික් ටොන් 150ට අඩු සම්පූර්ණ ධාරිතාවයකින් යුත් විශාල පැට්‍රල් ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම්.
3. දිනකට කිලෝග්‍රෑම් 100කට අඩු කිලෝග්‍රෑම් 50ට වැඩි නිෂ්පාදන ධාරිතාවයකින් යුත් දුම්ගැසූ රබර් පොතු තැටි නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය.
4. තනිව නිෂ්පාදන පනතේ එක් ගොඩක පොල් කටු 10,000කට අඩු පොල්කටු 10,000කට වැඩි සම්පූර්ණ අභ්‍යන්තර මිලදී ගැනීම් සහිත පොල්කටු දැල්වීමේ කර්මාන්තය.
5. 25 දෙනෙකුට අඩු 10 දෙනෙකුට වැඩි සේවක පිරිසක් සේවයේ යොදවා ඇති ආයුර්වේද, දේශීය, බෙහෙත් නිෂ්පාදන, සම්බන්ධ කරන, බෙදන හෝ කර්මාන්ත.
6. ඊයම් උණු කර අකුරු සකස් කිරීම හැර ඇති මුද්‍රණාල.
7. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවා බතික් කර්මාන්තය.
8. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවා ෆයිබර්ග්ලාස් මූල ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ කර්මාන්ත.
9. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා ස්වාභාවික ද්‍රව්‍යමය දියකිරීම් ද්‍රව්‍ය යොදවා වේලන සෝදන ක්‍රියාවලිය සම්බන්ධ වාණිජමය ඇපිල්ලීම් හල්.
10. කේක් කර්මාන්ත නිපදවන ඉවත් නොකරන සම් පදම් කරන කර්මාන්ත.
11. ස්වභාවික කොළ පදම් කිරීම හෝ සායම් දමන ක්‍රියා, නොකරන පොල් කෙඳි කර්මාන්ත ශාලා
12. 25කට අඩු පේෂ යන්ත්‍ර සහිත පේෂකර්මාන්තශාලා.
13. 10කට වැඩි අත් යන්ත්‍ර සහිත අත් කර්මාන්ත
14. සීනි කර්මාන්තශාලාවක් හෝ සීනි පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන හැර උක් කර්මාන්ත ශාලා.
15. 25 දෙනෙකුට අඩු 5 දෙනෙකු ට වැඩි සේවක පිරිසක් යොදවා එළවළු, පළතුරු, මස්, මුහුදු මාළු හා කිරි පදම් කිරීමේ කර්මාන්ත ශාලා.
16. 25 දෙනෙකුට අඩු 10 දෙනෙකුට වැඩි සේවක පිරිසක් යොදවා පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.
17. 25 දෙනෙකුට අඩු 05 දෙනෙකුට වැඩි සේවකයින් සේවයට යොදා ඇති බේකරි නිෂ්පාදන බිස්කට් රස කැවිලි නිෂ්පාදන කර්මාන්තශාලා
18. සේවකයින් 25කට අඩු 10 ට වැඩියෙන් සේවයේ යොදා මත්ද්‍රව්‍ය නොවන පානීය නිෂ්පාදන පිරිසිදු කිරීමේ කර්මාන්තශාලා

19. කෝස්ටික් සෝඩා පාවිච්චි කළ බෝතල් සෝදන ක්‍රියා වලින් ඇති අතිකුත් බෝතල් පුරවන ස්ථාන
20. දිනකට කිලෝග්‍රෑම් 500 කට අඩු නිෂ්පාදන ධාරිතාවයකින් යුත් තෙත් ක්‍රියාකාරිත්වයෙන් යුත් හාල් මෝල්.
21. වියළි ක්‍රියාවලිය සම්බන්ධ හාල් මෝල් (තෙත් අනුගමනය නොකරන)
22. ඇඹරීමේ මෝල්.
23. කුකුළන් 2500කට අඩු 50කට වැඩි සත්තු ඇති කරන කුකුල් ගොවිපළවල්.
24. ඌරන් 05ට වැඩි 50කට අඩු ඌරන් ඇති කිරීමේ ඌරු කොටුවක්
25. 50කට අඩු 10කට වැඩි සතුන් සිටින හරක්/එළුපට්ටි
26. දිනකට මෙට්‍රික් ටොන් 25කට අඩු නිෂ්පාදන ධාරිතාවයකින් යුත් සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලා.
27. කිලෝ 300කට අඩු කිලෝ 100කට වැඩි තොග නිෂ්පාදන හැකියා තත්ත්වයක් ඇති ජලය හෝ සූර්ය හෝ සුළං බල ශක්ති නොමැති විදුලි උත්පාදන කර්මාන්ත ශාලා.
28. දිනකට ඝන මීටර් 50කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් ඇති කොන්ක්‍රීට් මිශ්‍රණ නිපදවීමේ මධ්‍යස්ථානයක්.
29. කොන්ක්‍රීට් අච්චු කර්මාන්ත ශාලාවක්.
30. අච්චු මාර්ගයෙන් සිමෙන්ති කණු සකස් කිරීමේ කර්මාන්ත.
31. මෙට්‍රික් ටොන් 20කට අඩු නිෂ්පාදන බලයක් ඇති හුණු කම්හල්
32. 25 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවන ලද මැටි භාණ්ඩ කර්මාන්තශාලා.
33. උළු හා ගඩොල් පෝරණු.
34. අත් උපකරණ පාවිච්චි කර අතින් කඩන ක්‍රියාවල් නොවන දිනකට ඝන මීටර් 25කට අඩු නිෂ්පාදන ප්‍රමාණලත් පුච්චන කඩන හෝ පදම් කරන කර්මාන්ත.
35. දිනකට මෙට්‍රික් ටොන් 5කට අඩු ඇද ගැනීමේ ප්‍රමාණවත් ලිප.
36. බෝරොන් උපකරණ අතිකුත් බෙහෙත් පලුදු නොවන ආරක්ෂා සම්බන්ධ කර්මාන්ත
37. දිනකට ඝන මීටර් 50කට අඩු ප්‍රමාණයේ ඇති ඉරන පට්ටල්
38. අශ්වබල තුනකට (03) වැඩි බලය පාවිච්චි කරන වඩු කම්හල්
39. කාමර 20කට අඩු තානායම් අමුත්තන් නැවතුම් ස්ථාන අතිකුත් විවේක ස්ථානවල්
40. 05ට වැඩි සේවකයින් සේවයට යොදා උයන පහසුකම් ඇති නමුත් නවැතුම් පහසුකම් නැති තානායම්
41. 25 දෙනෙකුට වැඩි හා 200කට අඩු සංඛ්‍යාවකට නිදන පහසුකම්, නැවතීමේ පහසුකම් සලසාගත හැකි තානායම්
42. මාරුවෙන් මාරුවට සේවකයින් 01ට වැඩි හා 200කට අඩුවෙන් සේවයට යොදවා ඇඳුම් මැසීමේ කර්මාන්තශාලා.
43. මාසයකට ඝන මීටර් 600කට අඩු නිෂ්පාදන ධාරිතාවයකින් යුත් බෝර පිරවීමේ ක්‍රියාවලිය.
44. 25 කට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා, ලියවන පට්ටල් වැල්ඩින් වැඩපොලවල් ඇතුලු කර්මාන්තශාලාවල් යන්ත්‍ර, යන්ත්‍ර සූත්‍ර උපකරණ නිෂ්පාදන හෝ ඒකාබද්ද කිරීමේ කර්මාන්තශාලා.
45. වාහන අලුත්වැඩියා කිරීම, ගෑස් පිරවීම, වාහන රැකබලාගැනීම ආදිය සිදුකරනු ලබන ස්ථාන
46. සනීපාරක්ෂක ස්ථාන.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/5

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන අධිකාරියේ ව්‍යවස්ථා හා උප විධිවිධාන පනත

1952 අංක 06 දරන පළාත් පාලන අධිකාරියේ (ව්‍යවස්ථා හා උපවිධිවිධාන) පනතේ 261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ දී 2015.01.20 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව

*යෝජනාව*

"පළාත් පාලන, නිවාස ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 1988 වර්ෂයේ අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ(පළාත් පාලන) සභාවට අදාල බවට ගරු උතුරු නැගෙනහිර ආණ්ඩුකාරතුමා විසින් පිළිගනු ලැබ 1994 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වන දින අංක 842 දරන ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ (පළාත් පාලන) පළ කරන ලද්දාවූ ද ව්‍යවස්ථා හා උප විධිවිධානයේ I වැනි කොටසත් සම්මත අතුරු ව්‍යවස්ථා 11 වන කොටසේ සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා 01 සිට 42 දක්වා ඇති අතුරු ව්‍යවස්ථා ද වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (ව්‍යවස්ථා හා උප විධිවිධානයේ) පනතේ (261 වන පරිච්ඡේදයේ) 3 වැනි කොටසේ 1 වන උප වගන්තිය යටතේ වූ පනත (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තිය අනුව පිළිගන්නා බවට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව මෙයින් තීරණය කර ගන්නා ලදී.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/1

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

කසළ ඉවත් කිරීමේ පනත (126 වැනි පරිච්ඡේදය) යටතේ දැන්වීම - 2015

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ පවරා ඇති බලතල අනුව අංක 1024 හා 1998.04.17 වන දින පිළිගන්නා ලද 520/7 දරන අංකයෙන් හා 1988.08.23 වන දින දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ "කසල පවිත්‍ර කිරීමේ සේවය" ප්‍රාදේශීය සභාවෙන් ඉවත් කරන ලද පදිංචිකරුවෙකු හැර ඕනෑම නිවසක පදිංචිකරුවන් ප්‍රාදේශීය සභාවෙන් නියම කරනු ලබන පවිත්‍ර කිරීමේ ගාස්තුව ප්‍රාදේශීය සභාවට මාසිකව ගෙවිය යුතුය. ඒ අනුව කසල ඉවත් කරන සෑම නිවෙසක් වෙනුවෙන්ම මාසිකව රුපියල් 60ක ගාස්තුවක් වශයෙන් අය කරන බවට මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| කඩ, තේපැන්හල්වල කසල ඉවත් කිරීමේ ප්‍රමාණය අනුව | රුපියල් 200 0 සිට රුපියල් 1,800 0 |
| රජයේ පෞද්ගලික | |
| ආයතනවලට මාසිකව | රුපියල් 200 0 සිට රුපියල් 1,800 0 |
| හෝටල් මට්ටමේ | |
| භෝජනාගාර මාසිකව | රුපියල් 1,800 0 සිට රුපියල් 3,000 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/8

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත
(272 වැනි පරිච්ඡේදය) - 2015

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, ඇති කරනු ලබන සුනඛයින්, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) 4 වන වගන්තිය යටතේ 2013 වර්ෂයේ ලියාපදිංචි ගාස්තුව පිරිමි හෝ ගැහැණු හෝ කවර වර්ගයක වුවද එක් සතෙකු වෙනුවෙන් රුපියල් 50 ලෙස නියම කර ඇත. මෙම ගාස්තු ගෙවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/4

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2015

1987 ප්‍රාදේශීය සභා ආඥාපනතේ 126-7ඌ කොටසේ බාර කල උපමා අනුව 1988.08.23 වැනි දින 520/7 අතිවිශෙෂ චක්‍රලේඛනයේ පළාත් පාලන නිවාස හා නිර්මාණ ඇමතිතුමා විසින් ප්‍රසිද්ධ කළ (621ඒ, 631ඒ, 641ඒ) පිටුවල1998.04.17 වැනි දින අංක 1024 චක්‍රලේඛනයේ මා විසින් පිළිගත් ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සැලැස්ම අනුව වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයක කවුරු හෝ වේවා යම් කිසි පාරක් හෝ පාරට දිග්ගැසුණු ප්‍රචාරක පුවරු නැතහොත් තාවකාලික සංවිධානාත්මක නැතහොත් විවිධ අලංකාරවල් ස්ථාපිත හෝ ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමට වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. මෙවැනි ස්ථිර ස්ථාපිත ප්‍රචාරවලට වාර්ෂිකව නියමිත ගාස්තු ගෙවා අලුත් කිරීම කරනු ලැබිය යුතු බව දැනුවත් කරමි.

| | ස්වභාවය | රු. ශත |
|---|---|---|
| 1. | බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනයට තබන ස්ථිර ප්‍රචාරක දැන්වීම්වලට සෑම වර්ග අඩියකට එක් වර්ෂයකට හෝ එක් කොටසකට (නාම පුවරුවක දෙපැත්තේම දැන්වීම් දර්ශනය සඳහා තැබීමේ දී දෙපැත්තටම ගාස්තු අය කළ යුතුය.) | 100 0 |
| 2. | බැනරයකින් දර්ශනය සඳහා තබනු ලබන තාවකාලික දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම මාසයකට හෝ කොටසකට | 50 0 |
| 3. | ලැල්ලක හෝ යමක ආධාරයෙන් දර්ශණය සඳහා තබන විදුලි ආලෝකය සහිතව තබන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම වර්ෂයක් සඳහා හෝ එහි කොටසකට | 100 0 |
| 4. | ස්ථිර වෙළඳ පොළවල්වල දැන්වීම් සහිත නාම පුවරු - වර්ග අඩියකට | 100 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

04-134/17

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි අනුමැතිය - 2015

ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ 1987 වර්ෂයේ අංක 15 දරන පරිපාලන සභා පනතේ කොටස් 47 සිට 59 දක්වා එක්ව නිවාස සංවර්ධන ආඥාපනත (පරිච්ඡේදය 600) පැවතුම් 1998.01.01 දින සිට අපගේ ප්‍රාදේශීය සභාවට ඔබින පරිදි පැවැත්ම අනුව මා හට ඇති බලතල හා 1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව සභාවේ බල ප්‍රදේශය තුළ ගෙවල් සෑදීම හෝ වෙනත් ආයතන ඉදිකිරීමට ගොඩනැගිලි ඉදිකිරීමේ ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට එම පරීක්ෂණ වෙනුවෙන් අනෙකුත් දේවල් සම්බන්ධවත් පහත දක්වා ඇති උපලේඛන අනුව 2015.02.01 සිට ගාස්තු අයකිරීම මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි.

එම්. බාලසුබ්‍රමනියම්,<br>
සභාපති,<br>
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,<br>
නෙඩුන්කේණි,<br>
වවුනියාව,<br>
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *අංකය* | *විස්තර* | *2015 වර්ෂය සඳහා අයකිරීම් රු. ශත* |
|---|---|---|
| 01. | තාප්පයක් සෑදීම | 500 0 |
| 02. | ව්‍යාපාරික අවශ්‍යතාවයකට තාප්පයක් බැඳීම | 700 0 |
| 03. | වර්ග අඩි 500ට නොවැඩි බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට | 325 0 |
| 04. | වර්ග අඩි 500ට උසින් නොවැඩි බිම් ප්‍රමාණයක ව්‍යාපාරික ගොඩනැගිල්ලක් | 525 0 |
| 05. | වර්ග අඩි 500ට වැඩි වර්ග අඩි 1,500ට අඩු බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට | 500 0 |
| 06. | වර්ග අඩි 500ට වැඩි හා වර්ග අඩි 1,500 ඇතුළත | 700 0 |
| 07. | වර්ග අඩි 1,500ට වැඩි වර්ග අඩි 2500ට ඇතුළත් බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට | 800 0 |
| 08. | වර්ග අඩි 1,500ට වැඩි වර්ග අඩි 2500ක බිම් ප්‍රමාණයක් අඩංගු ව්‍යාපාරික ගොඩනැගිලිවලට | 1,000 0 |
| 09. | වර්ග අඩි 2,500ට වැඩි බිම් ප්‍රමාණයෙන් යුත් ගොඩනැගිලිවලට සෑම වර්ග අඩි 1,000ට අනික් කොටස්වලට | 250 0 |
| 10. | වර්ග අඩි 2,500ට වැඩි බිම් ප්‍රමාණයේ ගොඩනැගිලිවලට සෑම වර්ග අඩි 1,000ට වැඩි එහි එක් එක් වර්ග අඩි 1,000 කොටස්වලට | 450 0 |
| 11. | ගොඩනැගිල්ලේ වෙනස් කළ යුතු එහෙත් බිම් ප්‍රමාණය වැඩි නොවන ගොඩනැගිලිවලට | 250 0 |
| 12. | ගොඩනැගිල්ලේ ඉල්ලීම් අනුමත කර නමුත් නිසි කාලසීමාවේ අවසන් නොකර නැවත අලුත්වැඩියා ගාස්තු වර්ෂයකට | 400 0 |
| 13. | ගොඩනැගීම අවසන් වූ පසු පදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් ගාස්තු | 175 0 |
| 14. | සම්පූර්ණ නොකිරීමෙන් යළි අලුත් කිරීමේ ගාස්තුව වර්ෂයකට | 400 0 |
| 15. | ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 200 0 |
| 16. | ව්‍යාපාර කටයුතු සඳහා තාප්ප සෑදීම | 1,000 0 |

04-134/3

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### ගාස්තු අයකිරීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147,148,149,150(1), (2), 151, 152(1),(2), 153(1), 154(1) යන වගන්ති යටතේ 2015 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට 2015 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පහත සඳහන් උපලේඛන අනුව උරුම ගාස්තු රැකියා වෙනුවෙන් වරිපනම් අය කිරීම පිළිබඳව 11 වැනි අංක 2015.01.30 වැනි දිනයේ යෝජනා සම්මත වී ඇත. උරුම ගාස්තු සෑම දෙයක්ම උපලේඛනය අනුව 2015.03.31 වැනි දිනයට කලින් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දී ඇත.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව,
නෙඩුන්කේනි,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *වෙළඳාමේ විස්තර* | *2015 වර්ෂය සඳහා අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම (ඒ ශ්‍රේණිය) | 1,000 0 |
| 02. | තේ කඩයක් පවත්වාගෙන යාම (බී ශ්‍රේණිය) | 800 0 |
| 03. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 04. | තේ කඩයක් හා භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 05. | බේකරියක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 06. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 |
| 07. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 550 0 |
| 08. | හරක් මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 09. | මාළු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 10. | සමූපකාර වෙළෙඳසල් පවත්වාගෙන යාම | 1,000 0 |
| 11. | එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 12. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම - (ඒ ශ්‍රේණිය) | 1,000 0 |
| 13. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම - (බී ශ්‍රේණිය) | 550 0 |
| 14. | සිසිල්බීම වර්ග අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 15. | යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 16. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 17. | සිමෙන්ති පැකට් 20කට වඩා තබා අලෙවි කිරීම | 1,000 0 |
| 18. | ලී මෝලක් හෝ ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 19. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 20. | ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 21. | දර මඩුවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 22. | එළවළු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 |
| 23. | පොල් ගෙඩි 1,000කට වැඩි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 24. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියා කිරීම | 1,000 0 |
| 25. | පිදුරු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 26. | මත්පැන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 27. | කඩල අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 |
| 28. | පාපැදි අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 29. | පාපැදි අමතර කොටස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 30. | රූපවාහිණී හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 31. | ලේත් වැඩපලක් සහ යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 850 0 |
| 32. | සාමාන්‍ය කම්හලක් පවත්වාගෙන යාම | 400 0 |
| 33. | කොහු සහ ලණු නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 34. | රා එකතු කිරීමේ හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 35. | වැල්ඩින් වැඩපොලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 36. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 37. | බැටරි චාජ් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 38. | කුෂන් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |

| *අංකය* | *වෙළඳාමේ විස්තර* | *2015 වර්ෂය සඳහා අයකිරීම රු. ශත* |
|---|---|---|
| 39. | රූපවාහිණී, ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 40. | ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 |
| 41. | අලුත් පා පැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 42. | පැට්‍රල්, භූමිතෙල්, ඩීසල් තබා ගැනීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 43. | පෞද්ගලික වෛද්‍ය ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 44. | රෙදි පිළි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 45. | රෙදි පිළි කර්මාන්තයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 46. | කෘත්‍රිම පොහොර තබා ගැනීම | 1,000 0 |
| 47. | කෘමිනාශක බෙහෙත් අලෙවි කිරීම | 1,000 0 |
| 48. | පාවහන් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 49. | තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් අලෙවි කිරීම | 1,000 0 |
| 50. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 51. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන මිරිස් හා වෙනත් ධාන්‍ය අඹරණ මෝලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 52. | වී මෝලක් පවත්වාගෙන යාම ඒ ශ්‍රේණිය | 1,000 0 |
| 53. | වී මෝලක් පවත්වාගෙන යාම බී ශ්‍රේණිය | 800 0 |
| 54. | 100කට වැඩියෙන් ඇති කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 600 0 |
| 55. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 56. | ගීත කැසට් පටි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 |
| 57. | පුවත්පත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පත්වාගෙන යාම | 750 0 |
| 58. | රූපවාහිනී, වීඩියෝ කැසට් කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 59. | පදික වෙළඳාම් කිරීම | 300 0 |
| 60. | කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 61. | මනිබඩු සාප්පුවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 62. | කුකුල් කෑම අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 63. | ධාන්‍ය වර්ග අලෙවි කිරීම | 750 0 |
| 64. | ගඩොල් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 65. | සිමෙන්ති ගල් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 66. | කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 67. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 68. | තලතෙල් නිෂ්පාදන හා පිරවීම් මධ්‍යස්ථානයක් | 600 0 |
| 69. | ගෑස් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 70. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 71. | ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 72. | ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 73. | යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 74. | හුණු කම්හලක් පවත්වාගෙනයාම | 350 0 |
| 75. | හුණු පැකට් කිරීම හා අලෙවි කිරීම | 750 0 |
| 76. | ස්වර්ණාභරණ ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 77. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පත්වාගෙන යාම | 1,000 0 |
| 78. | ගල් වලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 79. | ගල් කැඩීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 80. | කලුගල් භාණ්ඩ නිපදවීම හා අලෙවි කිරීම | 1,000 0 |
| 81. | දුරකථන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 82. | නැවතීමේ පහසුකම් සහිත නවාතැනක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 83. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවි කිරීම | 1,000 0 |
| 84. | පැණි රස ටොෆි නිෂ්පාදනය කර අලෙවි කිරීම | 1,000 0 |
| 85. | මික්ෂර් නිෂ්පාදනය හා විකිණීම | 1,000 0 |
| 86. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 87. | සබන් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 |
| 88. | අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවි කිරීම | 1,000 0 |
| 89. | ඇඳුම්වලට බතික් දැමීම | 500 0 |
| 90. | දුම්කොළ නිෂ්පාදනය | 500 0 |
| 91. | අභ්‍යාස පොත් ආනයනය කිරීම | 1,000 0 |

| අංකය | වෙළඳාමේ විස්තර | 2015 වර්ෂය සඳහා අයකිරීම රු. ශත |
|---|---|---|
| 92. | අභ්‍යාස පොත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 93. | කුකුල් මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 94. | තැරව්කරු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 95. | ගොඩනැගිලි පිඹුරු සේවයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 96. | ගොඩනැගිලිවලට වයරින් කිරීමේ සේවාවක් | 1,000 0 |
| 97. | වාහන සර්විස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 98. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 99. | ඉලෙක්ට්‍රොනික් මෝටර් කොයිල් එතීම | 1,000 0 |
| 100. | අන්තර් ජාල පරිගණක පංති පවත්වාගෙන යාම | 1,000 0 |
| 101. | පෞද්ගලික පංති පවත්වාගෙන යාම | 500 0 |
| 102. | සංයුක්ත තැටි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 103. | බුලත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 |
| 104. | මෝටර් වාහන විකිණීම | 1,000 0 |
| 105. | ටයර් - ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් | 750 0 |
| 106. | පොල් අතු අලෙවි කිරීමේ ස්ථානයක් | 400 0 |
| 107. | පෞද්ගලික සව් බල කිරීමේ පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 108. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 109. | මෝටර් රථ අමතර කොටස් අලෙවි මධ්‍යස්ථානයක් | 1,000 0 |
| 110. | නෙට් කැෆේ | 750 0 |
| 111. | ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ගේ මධ්‍යස්ථානයක් | 1,000 0 |
| 112. | සුරතල් සතුන්ගේ මධ්‍යස්ථානයක් | 500 0 |
| 113. | මහා පරිමාණ රෙදි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 114. | ගවයින් 10 දෙනෙකුට වැඩි ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 |
| 115. | ගවයින් ඇති කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් | 1,000 0 |
| 116. | සිල්ලර බඩු අලෙවි මධ්‍යස්ථානයක් - ‍යූ | 1,000 0 |
| 117. | සිල්ලර බඩු අලෙවි සැලක් - ඩී | 800 0 |
| 118. | සිල්ලර බඩු අලෙවි සැලක් - ඊ | 650 0 |
| 119. | සිල්ලර බඩු විකිණීමේ සුළු ව්‍යාපාර ස්ථානය | 500 0 |
| 120. | ප්‍රවාහන භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර ස්ථානයක් (පාපැදිය සහ සුළු වර්ගයේ රථය) | 500 0 |
| 121. | ප්‍රවාහන භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර ස්ථානය (කුඩා රථ හැර, වෑන් රථ ඇතුළු වෙනත් රථ) | 1,000 0 |
| 122. | දුරකථන අටල්ල | 5,000 0 |
| 123. | ත්‍රිරෝද රථ | 3,000 0 |
| 124. | බැංකු සේවා වරිපනම් (සියලුම වෙන් වෙන් සේවා සඳහා) | 3,000 0 |
| 125. | පදික වේදිකා ව්‍යාපාරය සඳහා එක් දිනකට අයකරනු ලබන වරිපනම් ගාස්තු | 250 0 |
| 126. | උත්සව දිනවල අයකරනු ලබන වරිපනම් ගාස්තුව : | |
| | සුලු ව්‍යාපාර | 250 0 |
| | අයිස්ක්‍රීම් කඩයක් | 1,000 0 |
| | අයිස්ක්‍රීම් වෑන් රථයක් | 1,000 0 |
| | රටකජු කඩයක් | 500 0 |
| | ලෝහ භාණ්ඩ අලෙවි සල | 1,000 0 |
| | රූපාලාවණ්‍ය භාණ්ඩ විකිණීමේ සාප්පු | 1,000 0 |
| | හෝටල් | 1,000 0 |
| | ජංගම රථවල ව්‍යාපාර කිරීම | 500 0 |
| | පාපැදිවල ව්‍යාපාර කිරීම | 500 0 |
| | ජංගම බේකරි නිෂ්පාදනය | 1,200 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
වවුනියාව,
නෙඩුන්කේනි,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-134/2

**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

සතුන් වදහිංසා ආඥාපනත (පරිච්ඡේදය 272) 7(2) වැනි කොටස යටතේ දැන්වීම් - 2015 වර්ෂය

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවෙන් සමත් වූ බදුකරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් යම් කිසි මස් කටවල් සතුන් වද හිංසා පනතේ (පරිච්ඡේදය 272) 17(1) කොටස යටතේ මා හට දී ඇති බලතල අනුව සඳහන්ව ඇති උපලේඛන අනුව දක්වා ඇති දිනවල රජයේ සම්මත වූ දිනවලත් මා විසින් වරින් වර දැනුවත් කරනු දිනවලත් සතුන් විකිණීම ද, විකුණනු පිණිස එල්ලීමද, මස් කඩවල් විවෘත කර තබා ගැනීම මුළුමනින්ම වැලැක්විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේණි,
වවුනියාව.
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1. ශ්‍රී ලංකා නිදහස් දිනය.
2. මහාසිව රාත්‍රී දිනය.
3. වෙසක් පුර පසලොස්වක පෝය දිනය (රජයේ සම්මත වූ දිනවල්)
4. ලෝක සත්ත්ව දිනය.
5. මාසේ පුරපසලොස්වක පෝය දිනය.

04-134/6

---

**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ නිශ්චල දේපළ සඳහා වන දැන්වීම - 2015

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18(ඇ) 11 වගන්තියෙන් පැහැදිලිව මා වෙත පවරා ඇති බලතල අනුව වවුනියාව උතුර ප්‍රාදේශීය සභා පරිපාලන සීමා තුළ දක්නට ලැබෙන චංචල නිශ්චල දේපළ හා ඒවායේ වගකීම් පැවැරුම් සම්බන්ධයෙන් අප සභාවට හිමි මුලද්‍රව්‍ය හාරා ගෙන යන අයගෙන් විශේෂ සංවර්ධන ගාස්තුවක් පහත සඳහන් පරිදි අයකිරීමට 2015.01.20 වැනි දිනැති අංක දරන තීරණය සම්මත කොට ක්‍රියාත්මක කරන බව මෙයින් ප්‍රසිද්ධ කර දන්වා සිටිනු ලැබේ.

| *අනු අංකය* | *ස්වභාවය* | *අයකිරීම් රු. ශත* |
|---|---|---|
| 01 | ගල් කියුබ් එකක් පටවාගෙන යාමට | 66. 67 |
| 02 | ග්‍රැවල්පස් කියුබ් එකක් පටවාගෙන යාමට | 50. 00 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 21 වැනි දින,
නෙඩුන්කේණි,
වවුනියාව.
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-134/18

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 0 | 60 0 |
| III වැනි ඡේදය … … … … … … … | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 0 | 120 0 |
| II වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| III වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 0 | 60 0 |
| V වැනි කොටස … … … … … … … … | 123 0 | 60 0 |
| VI වැනි කොටස … … … … … … … … | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | | | | | |
| අප්‍රේල් | 2015.04.02 | බ්‍රහස්පතින්දා | 2015.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.10 | සිකුරාදා | 2015.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.17 | සිකුරාදා | 2015.04.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.04.24 | සිකුරාදා | 2015.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.30 | බ්‍රහස්පතින්දා | 2015.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2014.05.08 | සිකුරාදා | 2014.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.15 | සිකුරාදා | 2014.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.22 | සිකුරාදා | 2014.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.29 | සිකුරාදා | 2014.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.